

දිරිය දෑත්

# "ඉන්ධන මිල පහත දමව්"

## ඔබේ සහයට ඔහු සිටියි - රවි මල්ලවාරච්චි

වැඩිවන ඉන්ධන මිල පාලනය කිරීමට සමත් කිසිවකු නැති බව රහසක් නෙවෙයි. නමුත් ඒ සඳහා අපට ගත හැකි විකල්ප මාර්ග කීපයක්ම ඇත. මේ වකවානුව වන විට විද්‍යාඥයන් නොයෙක් මාදිලියේ නව ඉන්ධන සොයා පරීක්ෂණ කරමින් සිටින බව අපි දනිමු. නමුත් පැහැදිලි පිලියමක් තවමත් අපට පේන මානයේ නැත. ඉන්ධන වියදම පාලනය කර ගැනීමට සොයා ගත් පහසුම සහ ආරක්ෂාකාරීම පිළියම වාහන එල් පී ගෑස් වලින් ධාවනයට සකස් කිරීමයි. ඒ සඳහා අවුරුදු 20ක පළපුරුද්දක් ඇති අපේම ශ්‍රී ලාංකිකයකු ඔහුගේ නවතම ව්‍යාපාරය පසුගිය දා ආරම්භ කළා. ඔහුගේ දිරිය දෑත් ඔබට හඳුන්වාදීමටයි අපේ මේ වෑයම.

ඔහු සමර්ටන් එල්පී ජී කන්වර්ෂන්ස් ආයතනයේ අධිපති රවි මල්ලවාරච්චි යි.

ඔබට මේ ව්‍යාපාරය අරම්භ කරන්න පසුබිම හැදුනෙ කොහොමද?

කුඩා කාලයේ සිටම මගේ ආශාව කාර්මික අංශය කෙරෙහි යොමු වෙලා තිබුණා. මම කොළඹ නාලන්දා විද්‍යාලයේ අධ්‍යාපනයෙන් පස්සෙ ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය යටතේ කාර්මික පාඨමාලාවක් හැදෑරුවා. එයින් වාහන පිලිබඳ හොඳ දැනුමක් ලබාගන්න මට පුලුවන් වුණා. ඉන් පස්සෙ 1990 මම ඔසට්‍රේලියාවට ආවා. අපි එන කාලෙත් දැන් ඔස්ට්‍රේලියාවේ පවතින තත්වය වගේ තත්වයක් තමයි තිබුණෙ. රැකියා ප්‍රශ්නය ඉතාම උග්‍රව තිබුණා. මම ඒ වෙලාවෙදි තීරණය කළා අනාගතය ගැන සිතා එල්පීජී ගෑස් පිළිබඳව හදාරන්නට. ඒ අනුව මම කැන්ගන් බැට්මන් ටේෆ් ආයතනට ඇතුල්වී ඒ පිළිබඳ පාඨමාලාවක් හැදෑරුවා. ඉන් පස්සෙ මම කැම්බෆීල්ඩ් ගෑස් ආයතනයේ රැකියාවට බැඳුනා. එහිදී මම මේ ක්ෂෙත්‍රය පිළිබඳ අති විශාල දැනුමක් ලබා ගත්තා. වාහන ගෑස් කිරීම පිළිබඳ අවශ්‍ය වන සියලුම දේ මම ඉගෙන ගත්තා.

මේ කාලය වෙනකොට ඔස්ට්‍රේලියාවේ වාහන ගෑස් වලින් ධානවයට සකස් කිරීම පිළිබඳව දැඩි ඉල්ලුමක් තිබුණ ද?

ඔව්. ඒ කාලය වන විට මෙහේ තිබුණ ටැක්සි වලින් 95% ක්ම ගෑස් වලින් තමයි දිව්වෙ. ඒ නිසා ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ගෑස් වලින් වාහන ධාවනය පිළිබඳ ලොකු උනන්දුවක් තිබුනා. මම එතන අවුරුදු 17 ක් සේවය කළා. ඉන්පසුව තමයි මම මගේම කියලා සමර්ටන් ගෑස් ව්‍යාපාරය පටන් ගත්තෙ. මේ වෙන කොට ගෑස් කිරීම පිළිබඳව මට අවුරුදු 20ක පළපුරුද්දක් තියෙනවා.

වාහන ගෑස් වලට පිරිවර්තනය කිරීමෙන් පාරිභෝගිකයාට ලැබෙන වාසිය මොකක්ද?

මූලික ලාබය තමයි මුදල් පසුම්බියට දැනෙන ලාබය. මම එහෙම කියන්නෙ අද පෙට්‍රල් මිලෙන් බාගයකටත් වඩා ගෑස් මිල අඩු නිසා. එල්පී ගෑස් කියන්නේ ඕස්ට්‍රෙලියාවේ තිබෙන ලොකුම සම්පතක්. ලොක්යේ ලොකුම ගෑස් සම්පතක් තියෙන් රටක් තමයි ඔස්ට්‍රේලියාවෙ. ස්වභාවික ගෑස් මේ පොළොවෙන් කෙළින්ම ලබාගන්න හැකි වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ කර්මාන්තය මේ රටේ මේ තරම් ව්‍යාප්ත වෙලා තියෙන්නෙ. මෑතකදී කළ සමීක්ෂණයකට අනුව ජපානය හා ඇමරිකාව ඉන්ධන භාවිතය පාලනය කලේ නැත්නම් අනාගතයේ ලෝකයට විශාල පෙට්‍රල් හිඟයකට මුහුණ දෙන්නන වෙනවා.

අනෙක් වාසිය තමයි පරිසරයට වන සේවය. ගෑස් ඉන්ධන භාවිතය පෙට්‍රල් භාවිතයට වඩා පරිසර හිතකාමීයි.

ඕනෙම වාහනයක් ගෑස් වලට හරවන්න පුලුවන් ද?

සමහර යුරෝපීය වාහන ඇරුණාම ඕනෑම අලුත් හෝ පරණ හෝ වාහනයක් ගෑස් වලින් ධාවනය කරන්න හදන්න පුලුවන්.

වාහන ගෑස් වලට හරවනකොට රජයෙන් දීමනාවක් දෙනවා නේද?

ඔව්. රජයෙන් මේ සඳහා ඩොලර් 2000 ක දීමනාවක් ගෙවනවා. මේ දීමනාව ලබා ගැනීම සඳහා ඔස්ට්‍රේලියානු පුරවැසියකු හෝ ස්ථිර පදිංචිකරුවකු හෝ වීම අවශ්‍ය නැහැ. ජාත්‍යන්තර ශිෂ්‍යයකුට වුණත් මේ දීමනාව ලබාගන්න පුලුවන්. එකම අවශ්‍යතාව ඒ වාහනය ලියාපදිංචි කරන ලද වාහනයක් විය යුතුයි.

ඒ එක්කම නිවසක වාහන කීපයක් තිබෙනවා නම් ඒ වාහන නිවසේ එක් එක් සාමාජිකයන් නමින් ලියාපදිංචි කර තියෙනවා නම් ඒ වාහන සියල්ලටම මේ දීමනාව ලබා ගන්න පුලුවන්.

මේ දීමනාව ලබා ගැනීම අසීරු කාරණයක් ද?

නැහැ. කිසිමු අපහසුවක් නැහැ. වාහනය ගෑස් වලට හරවා අදාල ලියකියවිලා බාර දී සති කීපයකින් එම දීමනාව රජයෙන් ලැබෙනවා.

සමහර අය හිතනවා වාහන ගෑස් වලින් ධාවනය කිරීම ආරක්ෂා රහිතයි කියලා. මේක ඇත්තක්ද?

මේ සම්පූර්ණයෙන්ම බොරු මතයක්. සමහරු හිතනවා අනතුරකදී වාහනයේ ගෑස් නිසා ගිනිගනියි කියලා. වැදගත්ම දෙය තමයි වාහනයක ගෑස් පද්ධතියේ ආරක්ෂක කපාට ඒ කියන්නෙ සේෆ්ටි වැල්ව්ස් තුනක් තියෙනවා. යම් අනතුරකදී ගෑස් පද්ධතිය තැන් තුනකින් වැසී යනවා. ඒ නිසා ආරක්ෂාව ඉතාම තදින් සැළසෙනවා. නමුත් පෙට්‍රල් වාහන වන එහෙම ආරක්ෂක ක්‍රියාමාර්ගයක් නැහැ. මේ නිසා ඇත්තටම ගෑස් වාහනයක් පෙට්‍රල් වාහනයකට වඩා ආරක්ෂාකාරීයි. පසුගිය දා වික්ටෝරියාවේ ඇතිවුණ අති විශාල ලැව් ගිණි වලට අසුවුණ වාහන පරීක්ෂා කිරමේදීත් පෙනීගිය කාරණයක් තමයි ඒ වාහන වල ගෑස් ටැංකි වාහනය ගිණිගත් පසුවත් ආරක්ෂා කාරී ලෙස තිබීම.

ඔබේ පියා ප්‍රසිද්ධ ලේඛකයෙක්. ඇයි ඒ පැත්තට යොමු වුණේ නැත්තෙ?

ඔව්. මගේ පියා චන්ද්‍රසේකර මල්ලවාරච්චි. ඔහු ප්‍රසිද්ධ ලේඛකයකු වුණත් කිසිම විටෙක අපට ඒ අංශයේ යන්නැයි බල කළේ නැහැ. ඔහු විදෙස් තානාපති සේවයේත් සේවය කළා. වසර දහයකට පමණ පෙර ඔහු අභාවප්‍රාප්ත වුණා. මගේ අම්මා රූපා මල්ලවාරච්චි. මට සහෝදරයින් තුන්දෙනෙක් ලංකාවේ ඉන්නවා. මගේ සහෝදරියන් වන සන්ධ්‍යා සහ අනෝමා ඔස්ට්‍රෙලියාවේමයි පදිංචි.

> **මේ සම්පූර්ණයෙන්ම බොරු මතයක්. සමහරු හිතනවා අනතුරකදී වාහනයේ ගෑස් නිසා ගිනිගනියි කියලා. වැදගත්ම දෙය තමයි වාහනයක ගෑස් පද්ධතියේ ආරක්ෂක කපාට ඒ කියන්නෙ සේෆ්ටි වැල්ව්ස් තුනක් තියෙනවා. යම් අනතුරකදී ගෑස් පද්ධතිය තැන් තුනකින් වැසී යනවා. ඒ නිසා ආරක්ෂාව ඉතාම තදින් සැළසෙනවා. නමුත් පෙට්‍රල් වාහන වන එහෙම ආරක්ෂක ක්‍රියාමාර්ගයක් නැහැ. මේ නිසා ඇත්තටම ගෑස් වාහනයක් පෙට්‍රල් වාහනයකට වඩා ආරක්ෂාකාරීයි. පසුගිය දා වික්ටෝරියාවේ ඇතිවුණ අති විශාල ලැව් ගිණි වලට අසුවුණ වාහන පරීක්ෂා කිරමේදීත් පෙනීගිය කාරණයක් තමයි ඒ වාහන වල ගෑස් ටැංකි වාහනය ගිණිගත් පසුවත් ආරක්ෂා කාරී ලෙස තිබීම.**

පවුලේ විස්තර කිව්වොත්.

මගේ බිරිඳ මහේෂා. ලොකු පුතා මනිත් දෙවෙනි පුතා ජනිත් දුව වරුනි. මගේ ව්‍යාපාරයේ සාර්ථකත්ව පිටුපස ඉන්නෙ මේ අය තමයි. මගේ බිරිඳ මහේෂි මට ලබා දෙන සහය ඉතා විශාලයි. ඒ වගේම මගේ දරුවන් සහ හිත මිත්‍රයින් මගේ සියලුම කටයුතු සඳහා විශාල සහයක් ලබා දෙනවා.

රවි මල්ලවාරච්චි සිය ව්‍යාපාරයෙන් මේ වන විට ශ්‍රී ලාංකිකයන් තිදෙනෙකුට රැකියා අවස්ථා උදා කර දී තිබීම ඉතා වැදගත් කරුණකි. සිය ක්ෂෙත්‍රය පිළිබඳ මනා දැනීමක් සහිතව ඉදිරියටම යන ඔහු ඔස්ට්‍රෙලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාවට ආඩම්බරයකි.

ශ්‍රීනාත් මද්දුමගේ

